විෂයමාලා න්‍යාය හා භාවිතය -
දේශනය - 01
W.A. විමලසේන සර් - 2021. 9. 12
(12.30 – 3.30)

# විෂයමාලාව යනු කුමක්ද?



<u>විෂය අන්තර්ගතය :</u>

- විෂයමාලාව යන්න හැඳින්වීම
- විෂයමාලාව පිළිබඳ නිර්වචන
- විෂයමාලාව නිර්වචනයේදී මතුවන ගැටලු
- විෂයමාලාවේ පවතින ලක්ෂණ

# විෂයමාලාව හැඳින්වීම

අධ්‍යාපන පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා පාසල විසින් ප්‍රයෝජනයට ගනු ලබන අත්දැකීම් රාශියක සංකලනය ලෙස විෂය මාලාව පුලුල් වශයෙන් සඳහන් කළ හැකිය. එසේම නිර්මාණාත්මක හා විවේචනාත්මක චින්තනය, ගැටලු විසඳීම, අන් අය සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, මනා සංවිධානය, ඵලදායී ලෙස කටයුතු කිරීමේ හැකියාව , විශ්ලේෂණාත්මක කියවීම, ගැටලු විසඳීම, සියලු දෙනාගේ (සිසුන්) කුසලතා උපාය මාර්ග සහ පාසල් අත්දැකීම් යනාදිය පොදුවේ විෂයමාලාව ලෙස හැඳින්විය හැක. ඒ අනුව පාසල තුළ ක්‍රියාත්මක වන සියලුම අත්දැකීම් එනම් විෂය නිර්දේශය, විෂය භාහිර ක්‍රියාකාරකම් මේ සියල්ල විෂය මාලාවට අයත් වේ.

විෂය මාලාව යනු :

'' රටක ජාතික අරමුණු ඉටුකර ගැනීම සමාජයේ ජීවත් වීමේදී පුද්ගලයෙකුට එල්ල වන සියලු අභායෝගයන්ට මුහුණ දීම ආකල්ප, කුසලතා පමණක් නොව මනා පෞරුෂයක් සහිත ක්‍රියාකාරී පුද්ගලයෙකු බිහිකිරීම යන කරුණු සඳහා අධ්‍යාපන පද්ධතිය ඔස්සේ සැලසුම්කළ ඉගෙනුම් අත්දැකීම් මාලාවක එකතුවකි. ''

# විෂයමාලාව පිළිබඳ නිර්වචන

විෂයමාලාව සම්බන්ධයෙන් විවිධ අධ්‍යාපනඥයින් විසින් විෂය මාලාව සම්බන්ධ විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත. ඒවා කිහිපයක් පහත දැක්වේ.

'' **විෂයමාලාව යනු විශ්ව විද්‍යාලයක හෝ පාසලක හෝ දක්නට ලැබෙන අධ්‍යයන පාඨමාලාවක්** ''

- ඔක්ස්පර්ඩ් ශබ්ධ කෝෂය -

'' **විෂයමාලාව යනු , පාසල් සිසුන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා සමාජයේ කොටසක් විසින් සකස් කරන ලද අත්දැකීමය** ''

- බෝසව් (1961) -

'' **තම හැකියාවන් උපරිම තල වලින් මතු කරමින් නිශ්චිත ඉගෙනුම් ඵල සාධනය සඳහා සිසුන්ට සහය වන පාසල මඟින් සැලසූ ඉගෙනුම් අත්දැකීම්ය.** ''

- නිශ්ලි එවන්ස් (1967) -

**'' ඵලදායී ලෙස භාවිතා කළ හැකිවූ අධ්‍යාපනික සැලසුම්වල ලක්ෂණ සහිතව අධ්‍යාපන මූලධර්ම සන්දේශනය කිරීමේ ප්‍රයත්නයන්ය. ''**

- <u>ලොරන්ස් (1975)</u> -

**'' පාසල තුළදී හෝ පිටතදී කණ්ඩායම් වශයෙන් හෝ තනි වශයෙන් ගුරුවරුන් ඇතිව හෝ නැතිව සපුරා ගත හැකි වනසේ පාසල මගින් සැලසුම්කර මෙහෙයවනු ලබන සියළුම අත්දැකීම් විෂය මාලාවයි. ''**

- <u>කර් (1988)</u> -

**'' විෂය මාලාව යනු ආරම්භයක් හා අවසානයක් ඇතිව ක්‍රමානුකූලව සංවිධානය කරන ලද අත්දැකීම් සමුදායකි. ''**

- <u>කොන්රාඩ් (1978)</u> -

**'' විෂයමාලා යම් ආයතනයක් තුළදී හෝ ඉන් පිටතදී ගුරුවරයෙක් ඇති හෝ නැතිව අධ්‍යාපන මූලධර්ම වලට එකඟ වූ කළින්ම සැලසුම් කළ පුද්ගල සංවර්ධනය සමාජ සංවර්ධනය උදෙසා මෙහෙයවනු ලබන ක්‍රියාකාරකම් හා ඇගයුම් සහිත අත්දැකීම් වලින් යුත් ගතික අඛණ්ඩ ක්‍රියාකිරී ක්‍රියාවලියකි. ''**

**'' විෂය මාලාව යනු පාසලේ මාර්ගෝපදේශ යටතේ සිදුවන සියලුම ඉගෙනීමේ ක්‍රියාවලීන් සහ අත්දැකීම් වෙයි. ''**

- <u>රිච්ලින් සහ සුලර්</u> -

**'' විෂයමාලාව යනු පාසලක අධ්‍යාපනික වැඩ සටහන සංවිධානය කර ඇති ආකාරය හැඳින්වීම සඳහා සාමාන්‍යයෙන් යොදා ගන්නා වචනයකි. එහි අංශ 03 ක් ඇත. ඉගෙන ගන්නේ මොනවාද? ඉගෙනුම ලබන්නේ හා උගන්වන්නේ කෙසේද? විවිධ විෂයන් ඉදිරිපත් කරනු ලබන්නේ කවර අවස්ථාවලදීදී යනාදියයි. ''**

- <u>පිලිප්ස් (1958)</u> -

සමස්තයක් ලෙස ගත් කළ ඕනෑම පාඨමාලාවක්, වැඩ පිළිවෙලක් සඳහා නිශ්චිත පරමාර්ථ, අරමුණු, සුවිශේෂී අවශ්‍යතා ගොඩනගා තිබේ. විෂයමාලාවද ගොඩ නැගෙන්නේ ඒ ආකාරයටයි. ඒ අනුව ඕනෑම විෂය මාලාවක රටක ජාතික අරමුණු සමාජ අභියෝග ජයගැනීම, දැනුම ආකල්ප කුසලතා වර්ධනය කර ගැනීම, මනා පෞරුෂත්වයෙන් යුත් පුද්ගලයන් බිහි කිරීම, අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගීම යන කරුණු මත අධ්‍යාපන පද්ධතිය ඔස්සේ **<u>වැඩිදියුණු කළ, සැලසුම් කළ,</u>** ඉගෙනුම් ඉගැන්වීම් අත්දැකීම් සමුදායක එකතුවක් ලෙස විෂය මාලාව තව දුරටත් හඳුනාගත හැක.

# විෂය මාලාව අර්ථකථනයේදී මතුවන ගැටලු

විෂය මාලාව අර්ථකථනයේදී සමහර අවස්ථා වල ගැටලු මතුවීම දක්නට ලැබේ. විශේෂයෙන්ම විෂය මාලාව කා සඳහාද? විෂය මාලාව සැලසුම් කරන්නේ කුමක් අරමුණු කරගෙනද? කුමන දර්ශන මතවාද යොදාගන්නේද? ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද යොදා ගන්නේද? සමාජ සංස්කෘතික පසුබිම විෂය මාලාව ගොඩනැංවීමේදී යොදාගන්නේද යන්න අපට පෙන්වා දිය හැකිය. එබැවින් ඒ තුළින් ගොඩ නැගෙන විෂය මාලාව නිසා අර්ථකථනයේදී විවිධ මත හෝ ගැටලු පැනනැගිය හැක. ඒවායින් කිහිපයක් උදාහරණ වශයෙන් සලකා බලමු.

- **විෂය මාලාව යනු සමකාලීන සමාජයේ ජීවත් වීමට ඉතාමත් ප්‍රයෝජනවත් වන පාඩම් විෂය මාලාවයි.**

මෙම අර්ථකථනය අනුව සමාජයේ පවතින ගැටලු අනුව විෂය මාලාව තෝරාගනී. එම තේරීමේදී විෂය මාලාවේ ඉදිරි අභියෝග අවස්ථාවන් පිළිබඳව සඳහන් නොකරයි. එපමණක්ද නොව වැදගත්වන විෂයන් පමණක් උගන්වන අතර විෂයන් තෝරා ගැනීමට ඉඩකඩ සැලසී නැත. එමෙන්ම සමාජ සංවර්ධනය ගැනද වැඩි සැලකීමක් නොකරයි. මේ ආකාරයේ අර්ථකථනය තුළින් ගැටලු මතුවන බව පැහැදිළි වේ.

- **පාසල වගකියන සැලසුම් සහගත සියලුම ඉගැන්වීම් විෂය මාලාවයි.**

මෙම අර්ථකථනය අනුවද ඉගැන්වීම සැලසුම් සහගත ලෙස දකී. සමහරවිට මෙම අපේක්ෂිත සැලසුම් සහගත ඉගෙනුම පහසුවෙන් ලබා ගත හැකි එකක් විය හැක. එමෙන්ම සමහර ඉගෙනුම් කුමන පදනමකින් ලබා ගත්තාද? යන්න ගැටලු මතුවේ. තවද සැලසුම් නොකළ ඉගැන්වීම් ප්‍රතික්ෂේප වන්නේද යන්න ගැටලු මතුවිය හැක.

- **පාසල්වල මගපෙන්වීම යටතේ සියලුම අත්දැකීම් ඉගෙනීම විෂය මාලාව වේ.**

මෙම අර්ථකථනය අනුව අද්දැකීම් විෂය මාලාව ලෙස පැහැදිළි කරයි. එහෙත් මෙහිදී අපේක්ෂිත නොවන ඉගෙනුමක් යන්න පැහැදිළි නොවේ. එමෙන්ම මඟපෙන්වන නොමැති අත්දැකීම් ගැනද සඳහනක් නොවේ. ඒවාද විෂය මාලාවට අයත් වේ. තවද සැලසුම් කරන ලද, නොකරන ලද සියල්ලම විෂය මාලාවට අයත් වේදැයි පැහැදිළිව සඳහන් නොවේ. මේ ආකාරයට අර්ථකථනයේදී ගැටලු ඇතිවී ඇති බව වඩාත් පැහැදිළි වේ.

- **පාසලේ මාර්ගෝපදේශයේ සිදුවන සියලුම අත්දැකීම් විෂය මාලාව වේ.**

මෙම අර්ථකථන අනුව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පමණක් විෂය මාලාව ලෙස අදාල කරගෙන ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙන් බැහැරව විවිධ විෂය සමගාමී ක්‍රියාකාරකම් අත්දැකීම් ලබාදීම සඳහා උපයෝගී කර ගනී. එසේම විවිධ නිර්මාණාත්මක අත්දැකීම්, ස්වයං

ඉගෙනුමට පෙළඹවීම මෙම අර්ථකථනයේදී මතුකර නොමැත. මේ ආකාරයෙන් විෂයමාලා අර්ථකථනයේදී විවිධ ගැටලු මතුවන බව පෙනේ.

- **විෂයමාලාව යනු සිසුන්ට අධ්‍යාපන පරමාර්ථ හෝ ප්‍රතිපල ලබා ගැනීම සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරී වැඩසටහනකි.**

මෙම අර්ථකථනයේදී ශිෂ්‍යයාගේ පුද්ගලික පරමාර්ථ අරමුණු ඉටු කිරීමට විෂයමාලාව යොදා ගත්තද පුලුල් ලෙස සමාජ, ආර්ථික, සංස්කෘතික යන අංශ කෙරෙහි අවධානය යොමු කිරීමක් දක්නට නොලැබේ. විශේෂයෙන්ම සමාජ ආර්ථික ප්‍රගමනයන් ඇති කිරීමට දායක වීමට විෂයමාලාවක් තුළින් සිදුකළ යුතුය. එබැවින් එම අංශ ගැන වැඩි සැලකිල්ල නොදැක්වීම එහි ඌනතාවයක් ලෙස පැහැදිළි වේ.

## විෂය මාලාවක මූලික ලක්ෂණ

විෂයමාලාව වූ කලී පොදු ලක්ෂණ කිහිපයක් පෙන්වා දිය හැක. විෂයමාලාවක මූලිකාංග ලෙසද පහත දැක්වෙන ලක්ෂණ පෙන්නුම් කළ හැකිය. ඒ අනුව විෂයමාලාවේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහතින් දක්වමු.

- **විෂයමාලාව නතර වන ක්‍රියාවලියක් නොවේ.**
- **එය ස්ථාවර හෙවත් වෙනස් නොවන ක්‍රියාවලියක්ද නොවේ.**
- **එය ස්වභාවයෙන් ගතිකය.**
- **එය මුලමනින්ම පූර්ණ ශිෂ්‍ය සංවර්ධනය උදෙසා ක්‍රියාත්මකය**

ඒ ආකාරයෙන් විෂයමාලාව සම්බන්ධ විවිධ විද්වතුන් ඉදිරිපත් කර ඇති අදහස් අනුව මූලික ලක්ෂණ කිහිපයක් පහතින් දැක්වේ.

1. **විෂයමාලාව ඉගෙනීමේ අවස්ථා සංවිධානය සඳහා සකස්කළ සැකැස්මකි/සැලැස්මකි. එහි අරමුණු, පරමාර්ථ, ක්‍රියාමාර්ග හා ඇගයීම් ඇතුළත් වන බැවින් පද්ධතියක් ලෙසද හඳුන්වයි.**
2. **විෂයමාලාව නිශ්චිත ශිෂ්‍ය පිරිසක් සඳහා සැලසුම් කෙරේ. එම ශිෂ්‍ය පිරිසේ ස්වභාවය හඳුනා ගැනීම විෂය මාලාවේ ඵලදායීතාවයට වැදගත් වේ.**
3. **විෂයමාලාව සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත් පිළිබඳව නිසි අවබෝධයක් තිබිය යුතු වේ.**
4. **පාසලේ මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක කෙරෙන සියලුම විධිමත් අධ්‍යයන ක්‍රියාකාරකම් විෂයමාලාවට අයත් වේ.**
5. **විෂයමාලාවට සම්බන්ධ වන ගුරු පිරිසක් මෙන්ම ශිෂ්‍ය පිරිසක්ද සිටී.**

**එබැවින් විෂයමාලාවේ මූලිකාංග වන පරමාර්ථ, අපේක්‍ෂණ, ක්‍රියාකාරකම් සැලැස්ම, ඇගයීම් ක්‍රම නිවැරදි ලෙස සන්නිවේදනය කර ගත යුතුය.**

6. **විෂයමාලා ක්‍රියාකාරකම් වල මධ්‍යස්ථානය පාසල වන හෙයින් පාසලේ ඒ ආශ්‍රිත ප්‍රජාමය සම්පත් උපරිම ලෙස භාවිතයට ගැනීමට විෂයමාලා ක්‍රියාකාරකම් වලදී වැදගත් වේ.**

7. **විෂයමාලාව නිරතුරුවම ඇගයීමට භාජනය වේ. කාලීන අවශ්‍යතා හා වෙනස්කම් වලට භාජනය වේ. මෙය විෂයමාලාවේ අවශ්‍යම අංගයකි. එමෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අංශ වල සිදුවන වෙනස්කම් වලට අනුකූලව විෂයමාලාවේද අදාල සංශෝධන වරින් වර වෙනස් කිරීමට ඉඩකඩ තිබිය යුතුය. එනම් එය අඛණ්ඩ ක්‍රියාවලියක් විය යුතුය.**

<u>පැවරුම</u> :

- ♣ විෂයමාලාව යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි ඔබගේ වචනයෙන් පැහැදිළි කරන්න.
- ♣ විෂයමාලා අර්ථකථන කිහිපයක් පැහැදිළි කර පොදු නිර්වචනයක් ඔබේ අදහසින් ලියන්න
- ♣ විෂයමාලාවේ මූලික ලක්‍ෂණ ලයිස්තු ගත කරන්න.

Warwick, David – (1975)

සිසුන්ගේ මනෝවිද්‍යාත්මක අවශ්‍යතා, පවත්නා සම්පත් සහ කාලීන සංස්කෘතික ප්‍රවනතාවලට අනුකූලව පාසලක අධ්‍යාපනික පරමාදර්ශ පිළිබඳව සැලසුම් කර, ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙල විෂයමාලාවයි.

Stenhouse, L. A. – (1975)

අධ්‍යාපන යෝජනාවලියක අත්‍යවශ්‍ය මූලධර්ම හා ලක්ෂණ ගැන විවේචනාත්මකව සුපරීක්ෂාකාරී වීමටත්, ඒවා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමටත්, යොදා ගනු ලබන සන්නිවේදන ප්‍රයත්නයක් ලෙස විෂයමාලාව හැඳින්විය හැකිය.

Conrad, C. F. – (1978)

විෂයමාලාව යනු අශ්වයින් ධාවනය කරන ධාවන පථයක් සේ ආරම්භයක් හා අවසානයක් ඇති, කලින් තීරණය කරන ලද මාර්ගයක් සහිත, ක්‍රමානුකූලව සංවිධානය කරන ලද අත්දැකීම් සමුදායක් වේ.

Lawton, D – (1975)

කවුරුන් විසින්, කවරක්, කවරෙකුට, කුමක් සඳහා, කෙසේ, කවර ප්‍රතිඵල අපේක්ෂිතව උගන්වන්නේ ද? යනු විෂයමාලාවක පූර්ණ සමාජ විද්‍යාත්මක ස්වරූපයයි.

Chapter 4, PA State Board of Education

A series of planned instruction that is coordinated and articulated in a manner designed to result in the achievement by students of specific knowledge and skills and the application of this knowledge.

"Curriculum" means the planned interaction of pupils with instructional content, materials, resources, and processes for evaluating the attainment of educational objectives.

The word "curriculum" comes from a Latin word meaning to run a race. That may explain the hectic pace of schools! In current use, people generally think of the curriculum as "the course to be run," which implies it is not the actual running.

Peter F. Oliva, in his book, Developing the Curriculum (1997, p. 4),

Curriculum is that which is taught in school; a set of subjects; content; a program of studies; a set of materials; a sequence of courses; a set of performance objectives; a course of study; everything that goes on within the school, including extra-class activities, guidance, and interpersonal relationships; that which is taught both inside and outside of school directed by the school; everything that is planned by school personnel; a series of experiences undergone by learners in school; that which an individual learner experiences as a result of schooling.

George J. Posner and Alan N. Rudnitsky, in their book, Course Design (1997, p. 8) Curriculum is not a process. . . . A more precise view of curriculum--and the common understanding of curriculum among laypeople--is that it is what is taught in school or what is intended to be learned. It does not refer to what is to be done in school or what is to happen in the learning process. Curriculum represents a set of intentions, a set of intended learning outcomes.

Debbie Hughes

Curriculum is the guideline and philosophy followed by all staff used to ...develop the content and teaching methods, of classes as well as develop the programs and activities that will best meet the needs of all the students.

## විෂයමාලාව පිළිබඳ නිර්වචන කිහිපයක්

Rivilin & Schular – (1943)

පාසලේ මාර්ගෝපදේශය යටතේ සිදුවන සියලුම ඉගෙනුම් ක්‍රියාවලිය සහ අත්දැකීම් සමූහය විෂයමාලාවයි.

Phenix, Philip - (1958)

විෂයමාලාව යනු පාසලක අධ්‍යාපනික වැඩ සටහන සංවිධානය කර ඇති ආකාරය හැඳින්වීම සඳහා සාමාන්‍යයෙන් යොදා ගන්නා වචනයකි. එහි අංශ තුනක් ඇත. ඉගෙන ගන්නේ මොනවාද? ඉගෙනුම ලබන්නේ හා උගන්වන්නේ කෙසේද? විවිධ විෂය ඉදිරිපත් කරනු ලබන්නේ කවර අවස්ථාවල දී ද යනාදියයි.

Alexander, W - (1959)

නිශ්චිත ජන සමූහයක් සඳහා පුළුල් අරමුණු හා සුවිශේෂ අරමුණු මුදුන්පත් කර ගැනීමේ අපේක්ෂාවෙන් ඉගෙනීම් අවස්ථා සම්පාදනය සඳහා සැකසූ සැලැස්ම විෂයමාලාවයි.

Beauchamp – (1961)

පාසලේ සිසුන්ට අධ්‍යාපනික අත්දැකීම් ලබා දීම සඳහා සමාජයේ කොටසක් විසින් සැලසුම් කරන ලද තැන් විෂයමාලාවයි.

Elezabath Maccia – (1965)

ගුරුවරයාගේ හා ශිෂ්‍යයාගේ අන්තර්සබඳතාව මගින් සිදුවන ඉගෙනුම විෂයමාලාවයි.

Taylor, P.H.– (1966)

විෂයමාලාව යන්නට විෂයකරුණු, ඉගැන්වීමේ ක්‍රම හා අපේක්ෂණ ඇතුළත්ය. මේවායේ අන්තර්ක්‍රියාකාරිත්වය තුළින් ක්‍රියාත්මක විෂයමාලාව සැකසේ.

Wheelar, D.K.– (1967)

පාසලේ මාර්ගෝපදේශය යටතේ ඉගෙනුම ලබන්නා වෙත ඉදිරිපත් කරනු ලබන සැලසුම් සහගත අත්දැකීම් සමූහය විෂයමාලාවයි.

Kerr, J. F. – (1968)

තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන්, පාසල ඇතුළත දී හෝ ඉන් පිටත දී, පාසල මගින් සැලසුම්කර ක්‍රියාත්මක කරනු ලබන, සියලුම ඉගෙනීම් විෂයමාලාවයි.

Hirst , P. – (1968)

ශිෂ්‍ය පිරිසක් වෙනුවෙන් අධ්‍යාපන අභිමතාර්ථ හෝ ප්‍රතිඵල හැකිතාක් දුරට ළඟා කර ගැනීම සඳහා පිරිසැලසුම් කළ ක්‍රියාකාරී වැඩසටහනකි.

Whitfield, Richard – (1971)

පාසල විසින් සැලසුම් කර, සංවිධානය කරනු ලබන සියලු ඉගෙනුම් අත්දැකීම් සමුදාය විෂයමාලාවයි.

Good – (1973)

ශිෂ්‍යයාට උපාධියක් හෝ සහතිකයක් ලැබීමට හෝ වෘත්තීය ක්ෂේත්‍රයකට ප්‍රවේශවීමට හෝ යෝග්‍ය වන්නා වූ සමස්ත විෂය ව්‍යුහයේ සැලැස්ම සහ ඉගැන්වීම සඳහා යොදා ගන්නා ක්‍රම සහ උපකරණ විෂයමාලාවයි.